## පාරිසරික ගැටළු අවම කරමින් පරිසර සංරක්ෂණයට බෞද්ධ දර්ශනික ඉගැන්වීම්වල වැදගත්කම


පී.ආර්.එස්. ලියනාච්චි
සමාජවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.



## ABSTRACT

පරිසරය සජීවීය. එය සම්පතකි. පරිසරය නම් සජීවී සම්පත නොතිබුණි නම් මානවයා අද නැත. ඒ තරමටම මිනිසා හා පරිසරය අතර ඇත්තේ නොබිඳිය හැකි බැඳීමකි.මිනිසා තමා අවම ඇති සියලුම භෞතික අභෞතික දෑ පරිසරය යැයි හඳුනාගන්නා අතර පරිසරය අසීමිතව තම පැවැත්ම උදෙසා ප්‍රයෝජනයට ගනී.පරිසරය සම්පතක් වුවද ක්ෂය වීම අනිවාර්ය ක්‍රියාවලියකි.මිනිසා පාරිසරික නිර්මිතයක් බැවින් ක්ෂය වන පරිසරය සුරක්ෂිත කිරීමේ අමිල කාර්යයට මානවයාට අනිවාර්යයෙන්ම මැදිහත් වීමට සිදුවේ.ප්‍රශ්නය නම් පරිසරය අසීමිතව බුක්තිවිඳින මානවයා පරිසරයට පෙරලා ලබා දෙන දෑම එහි විනාශයට ක්ෂයවීමට හේතුවන අවස්ථා අපට හමුවීමය. එම පරිසරය විනාශය තුළින් පෙරලා මානවයා මුහුණ දෙන පරිසර ගැටළු දිනෙන් දින උග්‍රවීම තුළ මානවයාට පරිසරය හා පරිසර සංරක්ෂණය පිළිබඳව අලුතින් සිතන්නට සිදුවී තිබේ. පරිසර සංරක්ෂණය,තිරසර සංවර්ධනය, ස්වභාවික සම්පත් සංරක්ෂණය ආදී විවිධ මාතෘකා පරිසරය සම්බන්ධව නූතනයේ සාකච්ඡාවට බඳුන් කෙරේ. කොතෙක් වැඩසටහන්/දැනුවත් කිරීමේ/ව්‍යාපෘති/ සම්මන්ත්‍රණ තුළින් නූතන මානවයා පරිසරික වැදගත්කම හා එය රැකගැනීම සම්බන්ධව සාකච්ඡා හා විවිධ ක්‍රියාමාර්ගවල අතීතයට වඩා නිරත වුවද මිනිසාගේම අනිටු ක්‍රියාකාරකම් පරිසරයට එරෙහිව පවතී. එබැවින් පරිසර සංරක්ෂණය සම්බන්ධව නව දෘෂ්ටිකෝණයකින් කරුණු විග්‍රහ කිරීම මෙම අධ්‍යයනයේ මුඛය පරමාර්ථය වූ අතර බෞද්ධ දර්ශනය තුළ පරිසර සංරක්ෂණය සම්බන්ධව පවතින අදහස් පිළිබඳ සොයා බැලීමකට ලක්කරන ලදී.

ත්‍රිපිටකය හා සූත්‍ර දේශණා පදනම් කරගනිමින් බෞද්ධ සමාජවිද්‍යාත්මක ප්‍රවේශයක් ඔස්සේ සිදුකරන ලද මෙම පර්යේෂණයේ පර්යේෂණ ක්‍රමවේදය ලෙස ඓතිහාසික ක්‍රමය හා තුලනාත්මක ක්‍රමය යොදාගත් අතර දත්ත රැස්කිරිමේ ශිල්ප ක්‍රමය ලෙස නිරීක්ෂණය යොදාගැනුනි. විශේෂයෙන්ම බුදු දහමේ මිනිසාට භෞතික පරිසරය හා සිය ආධ්‍යාත්මික පරිසරය යහපත්ව පවත්වා ගැනීමේ වැදගත්කම පිළිබඳව අවධාරණය කොට තිබේ. සරලව ගතහොත් සුදුසු පෙදෙසක වාසය කිරීම (පතිරූප දේස වාසෝච) මංගල කරුණක් වශයෙන් බුදුන් මංගල සූත්‍රයේදී අනුදැන වදාරා තිබීමෙන්ම යහපත් පරිසරයක වැදගත්කම බෞද්ධ දර්ශනය අනුමත කර ඇති බව පසක් කර ගත හැකිවේ.



මුඛ්‍ය පද : පරිසර සංරක්ෂණය, බෞද්ධ දර්ශනය, ආධ්‍යාත්මික පරිසරය, ත්‍රිපිටකය.